**නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,**
**අපද්‍රව්‍ය බැහැරකිරීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු**
**රාජ්‍ය අමාත්‍යාංශය**

# නාගරික සංවර්ධන අධිකාරිය

# ඇබෑර්තු

පහත සඳහන් තනතුර යටතේ පවතින ඇබෑර්තුව සඳහා සුදුසු පරිදි සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර
## HM 2-2-2016

**සුදුසුකම් :**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් වාස්තු විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව හෝ වතු කළමනාකරණය හා තක්සේරුකරණය හෝ නගර සැලසුම් හෝ නාගරික සංවර්ධනයට අදාළ ඕනෑම අනෙකුත් ක්ෂේත්‍රයක් සඳහා ගෞරව හෝ විශේෂ උපාධියක්

සහ

ඉහත ක්ෂේත්‍රයන්හි හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටුවා ඇති පිළිගත් වෘත්තීය ආයතනයක ඡන්ද බලය සහිත සාමාජිකයකු වීම

සමග

අදාළ මූලික සුදුසුකම් ලබාගැනීමෙන් පසුව රජයේ, සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක සනාථ කළ හැකි සේවා වර්තාවක් සමග කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 20 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, එයින් වසර හතක (07) පළපුරුද්ද ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

**වැටුප :** HM 2-2-2016 - රු. (93,020/- 12 x 2,700/- - 125,420/-)

**පොදු කොන්දේසි :**

- අ. අයදුම්කරුවන් වයසින් අවුරුදු 45 ට අඩු විය යුතුය. රාජ්‍ය / සංස්ථා සේවයේ නියුතු අපේක්ෂකයන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.
- ආ. මෙම පත්වීම් ස්ථිර පදනම මත වේ.
- ඇ. සේවක අර්ථ සාධක අරමුදල (අධිකාරියේ දායකත්වය 15%)
- ඈ. සේවක භාරකාර අරමුදල (අධිකාරියේ දායකත්වය 3%)

**අමතර ප්‍රතිලාභ :**

- අ. නාගරික සංවර්ධන අධිකාරියේ නිවාස ණය හා ආපදා ණය යෝජනා ක්‍රමය
- ආ. වාර්ෂික ප්‍රසාද දීමනාව
- ඇ. භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම
- ඈ. වෛද්‍ය රක්ෂණය

මෙම තනතුරට අදාළ කාර්යයන් ඉටුකිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය කායික හා මානසික යෝග්‍යතාවය සෑම අයදුම්කරුවෙකු සතු විය යුතුය.

රජයේ / රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන් මගින් යොමු කළ යුතු අතර, පිටපතක් සෘජුව පහත ලිපිනය වෙත යොමු කළ යුතුය.

අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් සම්පූර්ණ ජීව දත්ත, අදාළ සහතිකවල පිටපත් සමග දින 10 ක් ඇතුළත පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය.

**සභාපති,**
**නාගරික සංවර්ධන අධිකාරිය,**
**09 වන මහල, සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**